# Project 212
# 212 වන ව්‍යාපෘතිය




DP EDUCATION

## Coding School




වෙබ් පිටුව බලන්න

Glitch ආරම්භ කරන්න


LIVEWORKSHEETS

# HTML සහ CSS භාවිතා කරමින්  Generate a Random Password වන web side එකක් නිර්මාණය කරමු.

මෙම පාඩම් මාළාව අධ්‍යනය කිරීම මඟින් ඔබට අභඹු මුරපදයක් ජනනය කර ගත හැකි web page එකක් නිර්මාණය කිරීමට අවශ්‍ය උපදෙස් ලැබෙයි.

212 වන ව්‍යාපෘතිය නිර්මාණය කිරීම මඟින් අභඹු මුරපදයක් ජනනය කර ගත හැකි web page design එක html සහ CSS වලින් සිදු කර ගත හැකි වේ.

මෙම 212 වන ව්‍යාපෘතිය නිර්මාණය කිරීම මඟින් ඔබට පහත පරිදි web page කොටසක් නිර්මාණය කර ගත හැකි වේ.




- මෙහිදී මීට අමතරව external CSS මඟින් CSS add කර ගන්නා ආකාරයද පැහැදිලි කරනු ලබයි.
- පළමුව index.html file එක තුළ මූලික වශයෙන් අවශ්‍ය වන tags පහත පරිදී සකස් කර ගන්න.

LIVEWORKSHEETS

```html
<!DOCTYPE html>
<html lang="en">
<head>
    <meta charset="UTF-8">
    <meta name="viewport" content="width=device-width, initial-scale=1.0">

    <title>Generate Random Password </title>
</head>
<body>
</body>
</html>
```

- ඉන්පසු එක එකට කර ගන්නා ආකාරය බලමු.දැනටමත් ඔබගේ project එකෙහි files වල styles.css ලෙස file එකක් දැක ගත හැකි වේ.එය html file එක සඳහා add කර ගැනීමට index.html file එකෙහි ඔබ ඉහත සකස් කර ගත් code තුළ ඇති <head> tag තුළට පහත link tag එක ඇතුළත් කරන්න.

```html
<!DOCTYPE html>
<html lang="en">
<head>
    <meta charset="UTF-8">
    <meta name="viewport" content="width=device-width, initial-scale=1.0">
    <title>Generate Random Password </title>


   <link rel="stylesheet" href="style.css">

</head>
<body>
</body>
</html>
```

- අපි දැන් body tag එක තුළ div tag එකක් open කර ගනිමු.එම div tag එක සඳහා container ලෙස class එකක් සකස් කර ගනිමු.
- container ලෙස class එකක් සකස් කර ගත් div tag එක තුළ h1 tag open කර ගන්න. එම h1 tag තුළ Generate a Random Password ලෙස text එකක් ලබා දෙන්න.
- ඉන්පසුව a සහ Random අතරට br tag එකක් එක් කර ගන්න.එවිට Generate a Random Password යන text එක පේළි දෙකක් ලෙස display වෙයි.
- ඉහත එක් කර ගත් Random Password යන වචනය span tag එකක් තුළට එක් කර ගන්න.
- h1 tag එකට පසුව div tag එකක් open කර ගන්න. එම div tag එක සඳහා displayලෙස class එකක් සකස් කර ගනිමු.
- display ලෙස class එකක් සකස් කර ගත් div tag එක තුළ input tag open කර ගන්න. එම input tag එකෙහි type එක සඳහා text ලෙසත්, id එක සඳහා password ලෙසත්, placeholder එක සඳහා password ලෙසත් එක් කර ගන්න.

LIVEWORKSHEETS

- එම input tag එකට පහළින් img tag එකක් open කර ගන්න.එම img tag එකෙහි src සඳහා assets තුළ ඇති පහත දැක්වෙන පිංතූරයට ආදාළ url එක copy කර paste කරන්න.



- display ලෙස සකස් කර ගත් div tag එකට පහළින් button tag එකක් open කර ගන්න. එම button tag එක සඳහා Generate  Password ලෙස text එකක් එක් කර ගන්න.
- Generate Password ලෙස එකක් එක් කර ගත් text එකට ඉදිරියෙන් img tag එකක් open කර ගන්න. එම img tag එකෙහි src සඳහා assets තුළ ඇති පහත දැක්වෙන පිංතූරයට ආදාළ url එක copy කර paste කරන්න.



- ඉහත සඳහන් විස්තර වලට අදාළ code පහත පරිදි සකස් කර ගන්න.

```
<div class="container">
    <h1> Generate a <br><span>Random Password </span></h1>
    <div class="display">
    <input type="text" id="Password" placeholder="Password">
      <img src="https://cdn.glitch.global/6387b866-6d91-4f74-85f6-2ea67ffc3a61/copy%20item.png?v=1709434862994">
    </div>

    <button> <img src="https://cdn.glitch.global/6387b866-6d91-4f74-85f6-2ea67ffc3a61/random%20item.png?v=1709612729925">  Generate  Password  </button>
</div>
```

- අපි දැන් ඉහත සඳහන් html කොටසට අදාළ CSS කොටස නිර්මාණය කරමු.
- ඒ සඳහා  style.CSS file එක තුළ මෙම CSS tag සකස් කරමු.

- මුළු web page එකටම අදාළව margin, padding, font family සහ box sizing සඳහා පහත පරිදි CSS සකස් කරමු.

```
*{
    margin: 0;
    padding: 0;
    font-family:'Poppins', sans-serif;
    box-sizing: border-box;
}
```

- Body tag එකට අදාළ CSS පහත පරිදි සකස් කරන්න.

```
body{
    background: #002339;
    color: #ffffff;
}
```

LIVEWORKSHEETS

❖ Container ලෙස එක් කර ගත් class එකට අදාළ CSS පහත පරිදි සකස් කරන්න.

```
.container{
    margin: 12%;
    width: 90%;
    max-width: 700px;

}
```

❖ display ලෙස එක් කර ගත් class එකට අදාළ CSS පහත පරිදි සකස් කරන්න.

```
.display{
    width: 100%;
    margin-top: 50px;
    margin-bottom: 30px;
    background: white;
    color: #ffffff;
    display: flex;
    align-items: center;
    justify-content: space-between;
    padding: 26px 20px;
    border-radius: 5px;
}
```

❖ container ලෙස එක් කර ගත් class එක තුළ ඇති h1 tag එකට අදාළ CSS පහත පරිදි සකස් කර ගන්න.

```
.container h1{
    font-weight: 500px;
    font-size: 45px;
}
```

❖ container ලෙස එක් කර ගත් class එක තුළ h1 tag එකක් ඇති. එම h1 tag තුළ span tag එකක් පවතී.එම span tag එකට අදාළ CSS පහත පරිදි සකස් කර ගන්න.

```
.container h1 span{
    color: #019f55 ;
    border-bottom: 4px solid #019f55;
    padding-bottom: 7px;
}
```

❖ display ලෙස එක් කර ගත් class එක තුළ ඇති img tag එකට අදාළ CSS පහත පරිදි සකස් කර ගන්න.

```
.display img{
    width: 20px;
    cursor: pointer;
    font-size: 24px;
}
```

❖ display ලෙස එක් කර ගත් class එක තුළ ඇති input tag එකට අදාළ CSS පහත පරිදි සකස් කර ගන්න.

```
.display input{
   border: 0px;
  font-size:25px;
    border-color: #ffffff;

}
```

LIVEWORKSHEETS

- container ලෙස එක් කර ගත් class එක තුළ button tag එකක් ඇත. එම button tag තුළ img tag එකක් පවතී.එම img tag එකට අදාළ CSS පහත පරිදි සකස් කර ගන්න.

```
}
.container button img{
    width: 20px;
    margin-right: 10px;
}
```

- container ලෙස එක් කර ගත් class එක තුළ ඇති button tag එකට අදාළ CSS පහත පරිදි සකස් කර ගන්න

```
.container button{
    border:0 ;
    outline: 0;
    background: #019f55;
     color:white;
    font-size: 22px;
    font-weight: 300;
    display: flex;
    align-items: center;
    justify-content: center;
    padding: 16px 26px;
    border-radius: 5px;
    cursor: pointer;
}
```

LIVEWORKSHEETS